# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
# கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
# Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


මගේ අංකය / எனது இல / My No. SP/CEC/1/O/5 | ඔබේ අංකය / உனது இல் / Your No. | දිනය / திகதி / Date 2021.12. 22

**චක්‍රලේඛ අංක : 06/2021**

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිතිවල සභාපතිවරුන් වෙත,

**<u>රාජකාරි කාලය තුළ සිදු වූ හදිසි අනතුරු හේතුවෙන් සමූපකාර සේවකයින්ට හදිසි අනතුරු නිවාඩු අනුමත කිරීම</u>**

සමූපකාර සේවක හදිසි අනතුරු නිවාඩු සම්බන්ධයෙන් පොදු විධිවිධාන මෙම කොමිෂන් සභාව විසින් මෙතෙක් නිකුත් කර නොමැති නිසා, සේවයේ යෙදී සිටියදී සමූපකාර සේවකයන්ට සිදුවන හදිසි අනතුරුවලදී නිවාඩු ලබා දීම සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලීම් රැසක් පසුගිය කාලය තුළ නිරීක්ෂණය විය. ඒ අනුව, ඊට අදාළ පොදු විධිවිධාන හා උපදෙස් ලබා දීමට මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. එහි පහත සඳහන් වගන්ති ප්‍රකාරව හදිසි අනතුරු නිවාඩු සම්බන්ධයෙන් කටයුතු කරන මෙන් කොමිෂන් සභා තීරණය පරිදි දැනුම් දෙමි.

2.1 සමූපකාර සමිතියක ස්ථිර සේවකයෙකු ඔහුගේ රාජකාරි කාලය තුළදී තමාට නියම කළ රාජකාරියෙහි යෙදී සිටියදී ඔහුගේ වරදක් නිසා සිදුවී යැයි කිව නොහැකි හදිසි අනතුරකින් තුවාල සිදුවී ඇත්නම් හෝ රාජකාරියට පැමිණීමේ දි හෝ පිටවීමේදී හදිසි අනතුරක් සිදු වී ඇත්නම් එම සේවකයාට හදිසි අනතුරු නිවාඩු ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලයට පුළුවන.

2.2 මෙසේ ලබා දෙන නිවාඩු ඔහුගේ සාමාන්‍ය නිවාඩු වලින් අඩු නොකළ යුතු වන අතර, සේවකයාට හිමි වෙනත් කිසිම වර්ගයක නිවාඩු හා එකට සම්බන්ධ කොට මෙම නිවාඩු ගණනය නොකළ යුතුය.

2.3 ඉහත 2.1 වගන්තියේ දැක්වෙන පරිදි හදිසි අනතුරකට භාජනය වූ සේවකයෙකුට නිවාඩු ලබාදීමේදී හැකි සෑම අවස්ථාවකම රජයේ රෝහලකින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතිකවල නිර්දේශ මත නිවාඩු ලබා දිය යුතුය. තව ද හදිසි අනතුරක් නිසා සිරුරේ කැඩුම් බිඳුම් සිදුවී ඇති අවස්ථාවල රෝගී සේවකයා, රජයේ ලියාපදිංචි දේශීය වෛද්‍යවරයෙකුගෙන් ප්‍රතිකාර ලබා ගන්නේ නම් සහ එමගින් ඔහු සුවය ලබමින් සිටින බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වන්නේ නම්, එම වෛද්‍ය සහතික මත නිවාඩු ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලයට පුළුවන. නිවාඩු කාලය දින 14 ක් ඉක්මවන අවස්ථාවලදී සෑම දින 14 කට වරක්ම තවදුරටත් නිවාඩු අවශ්‍ය වන බවට වෛද්‍යවරයා නිර්දේශ කරන්නේ නම්, එම නිර්දේශ මත නිවාඩු ලබා දිය යුතු ය.

2.4 රජයේ වෛද්‍ය නිලධාරියෙකු/රජයේ ලියාපදිංචි දේශීය වෛද්‍යවරයෙකු නිකුත් කල පිළිගත හැකි වෛද්‍ය සහතිකයක් මත සම්පූර්ණ වැටුප් සහිතව හය මාසයක්ද ඉන් පසුව අඩ වැටුප් සහිතව තවත් හය මාසයක් ද වශයෙන් හදිසි අනතුරු නිවාඩු ලබා දිය යුතුය.


ලේකම් / செயலாளர் / Secretary 091-2232794 | පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Administrative Officer 091-2234279 | කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax 091-2234383 | වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site www.cec.sp.gov.lk | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail empcommicoopsp@sltnet.lk

2.5 ඉහත 2.1 වගන්තියේ දැක්වෙන පරිදි සිදුවූ හදිසි අනතුරක් හේතුවෙන් සේවකයා බරපතල ලෙස දුබල තත්ත්වයට පත්වුණි නම්, සමිතිය විසින් එම සේවකයා රජයේ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයට යොමු කල යුතුය. එමඟින් ලබා දෙන නිර්දේශ මත එනම්,සේවකයාට තවදුරටත් සේවය කල හැකි ද, නොහැකි ද සහ පැවරිය යුතු රාජකාරිවල ස්වභාවය පිළිබඳ නිර්දේශ ලබාගෙන ඒ අනුව තවදුරටත් නිවාඩු ලබාදී සේවයේ රඳවා ගැනීමට හෝ සේවය සඳහා යෝග්‍ය නොවේ නම්, ඔහුගේ සේවය අවසන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කළ යුතු ය. එමෙන්ම කම්කරු වන්දි විධිවිධානයන්ට අනුකූලව ක්‍රියාකොට වන්දි ගෙවීමට කටයුතු යුතුය.

03. තවද, නිතා‍ය වශයෙන්ම රාජකාරී කාලය තුළදී හෝ රාජකාරියට පැමිණීමේ දී හෝ පිටවීමේදී සිදුවූ අනතුරක් ද යන්න විධිමත් මූලික විමර්ශනයකින් හා ලිපි ලේඛන මඟින් සනාථ කර ගැනීමෙන් අනතුරුව ඉහත පරිදි කටයුතු කළ යුතුය.

මෙම චක්‍රලේඛය 2021.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, කොමිෂන් සභාවේ අනුමැතිය මත නිකුත් කරන ලදී.

ජයන්ත ජී.ලියනගේ.
ලේකම්(වැ.බ.),
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත.

පිටපත :- 01. ලේකම් - කෘෂිකර්ම ගොවිජන සංවර්ධන....සමූපකාර අමාත්‍යාංශය(ද.ප) - දැ.ස.
02. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (ද.ප) - දැ.ස.
03. දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට